## ඉන්ග්ලිශ් රෝස්
**බණ්ඩාර කුමාරනායක**

ඉන්ගිලිශ් රොස මල කටු අතු අග පිපුනු
නෙලුවා චාල්ස් බබරුන් එන්නට කලින
බැලුවා ඔටුනු හිස මත ලස්සන රුවන
සගවා උඩු මහලෙ එක්ටැම් ගේ රැජින

රජ ලේ දුවන දරු දෙදෙනට අම්ම වෙලා
ඈය රැජිනියක් උනි රජෙකුගෙ බිරිද වෙලා
ඉන් නොනැවතී ලොව දරුවන් සොයා බලා
රජ මාලිගෙන් බැස මහ මග ගමන් කලා

කලු සුදු දිහා නිල් වන් නෙත් අගින් බලා
ලෙඩදුක් උනුන් ගෙන දෑතින් තුරුල් කලා
කරුනා ගුනය මතුකර රැජිනද නොබලා
මුල් රජ සිරිත් ඇය චුට්ටක් වෙනස් කලා

බොද වෙන පෙම් කතාවක අවසන ඇවිදින්
දෙදරා වැටුනෙ රජ පෙම් යුගයක නටබුන්
රෝසම රෝස මල ගලවා විස නටුවෙන්
පොඩිකර දැම්ම ලස්සන පේනවට බයෙන්

තාමත් ලස්සනයි පොඩිඋන රෝස මලේ
කාටත් මතක එමටයි හිටි ටික කාලේ
නාවත් ආයෙ අතු අග පිබිදෙන්න මලේ
තාමත් මතක සුවදයි සුන්දර තාලේ

## සිත සුදු කලු මිනිහා
**බණ්ඩාර කුමාරනායක**

ඉපදී ගමක ගැමි දරුවෙක් විලස කලක්
වින්දා සිරිය ගම පිනවන සැම දසුනක්
දුන්දා සහයෝගෙ අම්මට කැමති දෙයක්
ලත්දා උසස් ඉගෙනුම ඉහලින්ම ජයක්

නීතිය ගැන මනා දැනුමක් තුරුලු කරන්
අගමැති උනා කලු සුදු හැම පෙරටු කරන්
සිත සුදු කලු මිනිස විරුදාවක් ලැබුනෙන්
ආදරෙ කලා බාමට ලෝකෙම මිනිසුන්

මුලු මහ රටේ හැම පවුලට ආදරයෙන්
ගරු සේවය කලා හොර නෑ අබිමානෙන්
තම ප්‍රිය බිරිද දරු දෙදෙනත් රැක ගනිමින්
නම එක් කලා හිත හොද මිනිහෙක් විලසින්

ලස්සන පවුලකට මුල් තැන දී නිතැකින්
රැක ගත්ත දරුවන් හිට ගෙන දෙපයින්
විච්චූරන නැතිව අගමැති බිරිය ලෙසින්
යන්නට ගියා ආපසු තම නම තියමින්

දුප්පත් අපිව දකිනා පෝසත් මනසින්
ඇවිදින් බේර ගන්නට අසරන වහලුන්
සිනා මල් පුබුදු වන්නට හැම මූනෙන්
ආසයි දකින්නට බාමෙක් ලංකාවෙන්

## අද ඇසළ පෝදා නොවුනත්
**අතුල විජේවික්‍රම**

මන්ද තවමත්
පෙරළමින් පිටු
සුත්‍ර පිටකය
සසඳමින් අටුවාව

ජරාවට ගියනුන්
අපමණය
ගිලනුන් මළකඳන්
දසතමය
ශ්‍රමණයින් වඩී
මහමඟද
නාටිකාවන්ද
නොඅඩුවම

අද ඇසළ පෝදා
නොවුනත්
මඟ කළුවරක් නැත
දරුවා තුරුළු කර ගෙන
ඇයද සුව නින්දක

## අම්මා
**ජයසේන කොඩිතුවක්කු
වත්තල.**

රැයක් නෑ දහවලක් නෑ
වෙලාවක් නෑ කලාවක් නෑ
වැඩ ඉවර නෑ වෙහෙසකුත් නෑ
අම්ම වැනි අය ලොව තවත් නෑ

ඉවසීම මහමෙර පරදවයි
අහස ආදරයට පරාදයි
මෙත් කරුණා දෝරෙ ගලයි
අම්ම කවදත් අපට සුවඳයි

ගෙදර බබලන පහන වාගේ
දරු කැළට මුරකරු වගේ
අපිව නැළවුව ගී පදේ
අම්ම විය සත්සර නදේ

බත් රස නොදන්නී
දංකුඩ රස බලන්නී
සැමගෙ කුස් පුරවන්නී
අම්ම වැනි කෙනෙක් නොදනී

සදා මතකයෙ රැදෙන්නී
අපේ සිත්වල රැජිනී
දෙන පිං වල බලයෙනී
අම්ම බුදුවනු නියතී.

## අවාසනාව
**ජයසේන කොඩිතුවක්කු, වත්තල.**

දුක හිතට පුරුදුයි නුඹේ විරහව නිසා
වියැළිලා කඳුළු කැට ගලා ගිය පෙරදා
පොරකෑව සිතුවිලි නුඹේ සෙනෙහස පතා
නිසසලයි දැන් පැවිදි දරුවන් වගේ

සිත රැඳුන රුව නුඹේ අඳුරු සිතුවමකි දැන්
මතකයට ආවත් මැකී යයි අසරණව
මක්කරන්නද නුඹ කරපු පිං මදි වගේ
විඳින්නට සැප සතුට නොකැළැල් සෙනෙහසේ

දුර ඈත හිටියත් හමුවුනොත් අහම්බෙන්
ආසයි දකින්නට පුංචි දෑසේ සිනහවක්
ලෙන්ගතු කමට මිස නොවේ යලි සෙනෙහසක්
මට මාවවත් නැති ලොව මොටද තව බැඳීමක්





